ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

අංක. 9,609—1946ක්වූ ඔක්තෝබර් මස 4 වෙනි දිනවූ සිකුරාදා.

## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

Kegalla No. 73.—සබරගමු දිසාවේ කෑගල්ලේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට මේ 1946ක්වූ දෙසැම්බර් මස 7වෙනි දිනවූ සෙනසුරාදා උදේ 10.30ට කෑගල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ රබිරු වගාකරන්ට නොතොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෝජනාවී ඇත. සබරගමු දිසාවේ කෑගල්ල පලාතේ දෙහිගම්පල්කෝරලේ සහ පහත මුලත්ගම් කොරළේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

මුල් පිහියම් නො. A 473. ගම—රන්ගල්ල. අයිතිකම්කියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | ලොම් එකට මිල, රු. ශ. |
|---|---|---|---|---|---|
| 11 | හිම්බුටුගල .. | රන්ගල්ලේ පදිංචි බී. ඒ. හිංගිරිබණ්ඩා .. | අවුරුදු 25ක් වයස ඇති රබර් .. | 0 1 7 | 183 25* |

* ඉල්ලුම්කරුවාගෙන් ආණ්ඩුවට ගත් ඉඩම, බලපත්‍ර ජී. ඕ. 677 (5වෙනි මුද්‍රණය) යටතේ ආපසු විකිණීම පිණිසයි.

මේ ඉඩම සම්බන්ධව වැඩිදුර විස්තර කෑගල්ලේ උප ඒජන්තතුමාගෙන්ද, සිතියම් සර්වේයර් ජනරාල්තුමාගෙන්ද ලබාගත හැක.

මේ 1946ක්වූ සැප්තැම්බර් මස 24වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඇන්. මුනසිංහ,
අතිරේක ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමා වෙනුව.

---

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:— කම්බයමුනේ අළුත් පාඨශාලාවක් පිහිටුවීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "203 පරිච්ඡේදයේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන සංගාර්තුවල ප්‍රකාරයට පලාත් පාලක කාරක සභාවේ නියෝගය පරිදි උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමට අංක. A 1,131. ගම—ගල්වඩුකුඹුර.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නා. | මහත අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කලුහපුකනාතේ දෙමටගහමුල හේන | අවුරුදු 80ක්වූ කොස්ගස් 1ද, අවුරුදු 3–5 දක්වා වයස්වූ කොස්ගස් 19ද, අවුරුදු 4ක්වූ පොල්ගස් 30ද, අවුරුදු 3ක්වූ පුවක්ගස් 5ද, අවුරුදු 1ක්වූ දෙල්ගහක්ද, අවුරුදු 50ක්වූ අඹගහක්ද, අවුරුදු 20ක්වූ මාදම්ගහක්ද, අවුරුදු 20ක්වූ ලුනුමිදුල්ලගහක්ද, අවුරුදු 10ක්වූ කොච්චගහක්ද, එලවලුද, වැටිගසා පොල්අතු සෙවිලිකල ගොඩනැගිලි දෙකක්ද, හුනුබදාමෙන් බැදි නම වැල්ලක් සහ එසේම බැදි ගේට්ටු කනු 2කින් යුත් වත්ත | (1) කම්බයමුනේ මහවිහාරාධිපති ඒ. සාරිපුත්‍ර තෙරුන්නාන්සේද, (2) කම්බයමුනේ බෞද්ධ අධ්‍යාපන කොමිටියේ සභාපති තැන්පත් කේ. ඇම්. යූ. බණ්ඩා සහ (3) එම කොමිටියේ ලේකම්තැන්පත් කේ. බී. අබේකෝන් යන අයවලුන් වේත් | 0 2 11 |
| | | | | 0 2 11 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඔහැකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑම්දෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1946ක්වූ ඔක්තෝබර් මස 30වෙනි දින පෙරවරු 11.30ට යාතිහමට පලාපත්වෙල ගම්සභා උසාවියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනැවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1946ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින මාතලේ කච්චේරියේදීය.

සී. සිත්තම්පලම්,
මාතලේ ආණ්ඩුවේ උප ඒජන්ත වෙනුව.

---

ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—නාලන්දේ සිට පොරෝකාරගමට යන පාර දිගුකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "203වෙනි පරිච්ඡේදයේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" 5වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් පාලක කාරක සභාවේ නියෝගය පරිදි උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

83 දරණ අවසාන සිතියමේ අතිරේක අංක. 1. ගම—පොරෝකාරගම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 255 | අලපුගහකොටුව .. | මුලදී හේන්බිමක් සහ කුඹුර, දැනට ඔුබුබිම සහ පාරෙන් කොටසක් වේ | කිරිබරුවේ පදිංචි (1) අරඹේගෙදර ගුරුහාමි, (2) එම රංහාමි, (3) එම පියසේන, (4) එම හිංගිරිඅම්මා, (5) එම විකිරිමැණිකා, (6) මහආරච්චිල්ලාගෙදර මුදියන්සේ, (7) එම බණ්ඩාස, (8) එම විජයරත්න, (9) එම පුංචිරාල, (10) එම පහලගෙදර ගුරුහාමි, මේ. මු., (11) එම උක්කුමැණිකා | 0 1 18·3 |
| | | | | 0 1 18·3 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම හෝ තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වත් 1946ක්වූ ඔක්තෝබර් මස 31වෙනි දින පෙරවරු 10.30ට නාගසමට මාදිපොල ගම්සභා උසාවියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්දැයි කියා කියාසිටියට ඕනෑවා සහ ඉමට ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනක් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිති කමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1946ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින
මාතලේ කච්චේරියේදීය.

සී. සින්නම්පලම්,
මාතලේ ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොවැම්බර් 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒ නම් :— පොලොන්නරුවේ ගව ගාල විශාලකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කොටසේ කරතිබෙන පංගුර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් තිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

අතිරේක අංක 1—ඉන්පෙයිට් කො. 25. සිතියමේ කො. 9. ගම—කඩුගහවැව.

| අංක. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයින්ගේ නම්. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 804 | පනනවයල් .. | කුඹුරු ඉඩම .. | ඇම්. කාදර් මීරා, ඇස්. පී. සෙයියදු මුස්තාෆා .. | .. 13 1 35 |
| 805 | ගාසුකට්ටුවන්වයල් .. | එම .. | රස්. පිච්චෙකන්ඩු .. .. | .. 4 1 24 |
| 806 | වක්කනවලි .. | එම .. | පී. ශේගු උසාන්, ඇම්. උසන්කන්ඩු, ඇම්. සහරුවන්, ඇම්. කුප්පා උම්මා, ඇම්. උසන් සයිබු, පී. ඇල්. අදිජිගන් අප්පුහාමි, ඇස්. පී. සියාදු මුස්තාෆා, යූ. කතිචා උම්මා | 10 0 28 |
| 807 | මමිල්වායල් .. | එම .. | ඊ. මොහම්මදු ඉස්මයිල්, ඇස්. මීරකන්ඩු, ඇස්. කයිචා උම්මා, ඒ. මීරා මුහයියා තීන්, ඇම්. කාසිම්, ඒ. ඉස්සුමා ලෙබ්බෙ, ඊ. සියදෙවූජින්, ඒ. පී. උදුම්මා ලෙබ්බෙ, ඇම්. පිච්චෙකන්ඩු | 35 3 12 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම හෝ තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වත් 1946ක්වූ ඔක්තෝබර් මස 28වෙනි දින උදේ 9.30ට කතිසමට පොලොන්නරුවේ අදිසි කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්දැයි කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනක් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1946ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දින
අනුරාධපුරයේ කච්චේරියේදීය.

අයන් ඇම්. ද සිල්වා,
උ. මැ.ප. අතිරේක ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.